## 1:3
## පර්යේෂණ විස්තර

1:3:1 මාතෘකාව :- ප්‍රජා ගුවන් විදුලිය සංකල්පය තුළ ලාංකේය ප්‍රජා ගුවන් විදුලියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනයක්.

ප්‍රජා ගුවන් විදුලිය නමැති සංකල්පය කේන්ද්‍ර ගත වන්නේ ප්‍රජාව යන සංකල්පය හරහා සැබැඳි සාධක ගණනාවක් මතය. එකී සාධක ගණනාවක එකතුව මගින් ප්‍රජා ගුවන් විදුලිය නැමති ක්‍රමවේදය සාර්ථක බවට පත්වේ. මෙම නිබන්ධනය මගින් එකී ප්‍රජා ගුවන් විදුලි සංකල්පය තුළ ලාංකේය ප්‍රජා ගුවන් විදුලියේ හැසිරීම කුමනාකාරද යන්න අධ්‍යනය කරමින් ප්‍රජා ගුවන් විදුලි සංකල්පය න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික තලයේදී ද ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සාධක පිළිබඳව මෙහිදී සාකච්ඡාවට බඳුන් කෙරේ.

1:3:2 පර්යේෂණ ගැටළුව :- ප්‍රජා ගුවන් විදුලි සංකල්පය තුළ ලාංකේය ප්‍රජා ගුවන් විදුලියේ ක්‍රියාකාරීත්වය සාර්ථකද?

නූතන ලාංකේය ගුවන් විදුලි ක්‍රමවේදය තුළ ලෝක ප්‍රජා ගුවන් විදුලි සංකල්පය හමුවේ ලාංකේය ප්‍රජා ගුවන් විදුලිය ප්‍රායෝගික ලෙස සිය ක්‍රියාකාරිත්වය තුළ සාර්ථක බවක් පෙන්නුම් කොට තිබේදැයි මේ යටතේ පර්යේෂණයට ලක් කෙරේ.

1:3:3 උපන්‍යාසය :- ප්‍රජා ගුවන් විදුලි සංකල්පය තුළ ලාංකේය ප්‍රජා ගුවන් විදුලියේ ක්‍රියාකාරීත්වය අසාර්ථක වී ඇත.

වර්තමානයේදී දක්නට ලැබෙන ආකාරයට ප්‍රජා ගුවන් විදුලි සේවා ක්‍රමවේදය දෙස බලන කල ප්‍රජා ගුවන් විදුලි සංකල්පය ලාංකේය සමාජය තුළ අසාර්ථක බවට පත් වී ඇති බව දක්නට ලැබේ. මේ උපන්‍යාසය කොතෙක් දුරට සාධාරණීකරණය කළ හැකි ද යන්න මෙහි දී අවධානයට ලක්වනු ඇත.

1:3:4 අභිමතාර්ථ :-

1. ප්‍රජා ගුවන් විදුලි සංකල්පය තුළ ලාංකේය ප්‍රජා ගුවන් විදුලියේ හැසිරීම කවරාකාරද? යන්න පිළිබඳව සොයා බැලීම.
2. ලාංකේය ගුවන් විදුලිය බලගැන්වීමට අවශ්‍ය පියවර කවරේද? යන්න පිළිබඳව සොයා බැලීම.

3. ජනතාවාදී ප්‍රජා ගුවන් විදුලි සංකල්පය ක්‍රියාවට නැංවීමට ඇති බාධා පිළිබඳව අධ්‍යයනය සහ ඒවාට ඇති විසඳුම් කවරේද? යන්න පිළිබඳව සොයා බැලීම.

4. නව ප්‍රජා ගුවන් විදුලි වැඩසටහන් ආකෘති ඉදිරිපත් කිරීම සඳහා ප්‍රජාවගේ අදහස් හා යෝජනා කවරේද? යන්න පිළිබඳව සොයා බැලීම.

1:3:5 අරමුණ :- ප්‍රජා ගුවන් විදුලි සංකල්පය තුළ ලාංකේය ප්‍රජා ගුවන් විදුලිය බල ගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කවරේද? යන්න පිළිබඳව සොයා බැලීම.

1:3:6 අධ්‍යයනයේ සීමා :- කොත්මලේ ප්‍රජා ගුවන් විදුලිය ශ්‍රවණාය වන ප්‍රදේශ ආශ්‍රිතව ප්‍රශ්නාවලි භාවිතයෙන් දත්ත රැස් කර ගනු ලැබූ අතර ඊට පරිබාහිරව සෙසු ප්‍රජා ගුවන් විදුලි සේවා පිළිබඳව සම්මුඛ සාකච්ඡා හා සාහිත්‍යමය ලේඛන ඇසුරෙන් දත්ත රැස් කිරීම සිදුකරන ලදී.

1:3:7 ක්‍රමවේදය හා මූලාශ්‍ර :-

මෙම අධ්‍යයනය සිදු කිරීමේදී ක්‍රම කිහිපයක් යොදා ගන්නා ලදී.

1:3:7:1 ලිඛිත මූලාශ්‍ර :- සාහිත්‍යමය ලේඛන පරිහරණය, ප්‍රජා ගුවන් විදුලිය සම්බන්ධයෙන් ලියවී ඇති පුවත් පත්, ලිපි, වාර්තා, කෘතීන් මෙන්ම අන්තර්ජාල තොරතුරුද ප්‍රජා ගුවන් විදුලි ආශ්‍රිත වෙබ් අඩවිද නිරීක්ෂණය කරන ලදී.

1:3:7:2 අලිඛිත මූලාශ්‍ර :-

1:3:7:2:1 ප්‍රශ්නාවලි භාවිතය

කොත්මලේ ප්‍රජා ගුවන් විදුලියේ ශ්‍රවණ කලාපයට අයත් නාවලපිටිය, මාවතුර, කැකුළන්ද ආශ්‍රිත ප්‍රදේශ වල විවිධ පුද්ගලයන් 50 දෙනෙකු අතර බෙදා හරින ලද ප්‍රශ්න 40 කින් යුත් ප්‍රශ්නාවලියක් හරහා දත්ත රැස් කර ගන්නා ලදී.

1:3:7:2:2 විවිධ පුද්ගලයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම

කොත්මලේ ප්‍රජා ගුවන් විදුලිය හා ඌව, ප්‍රජා ගුවන් විදුලිවල බලධරයන් මෙන්ම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. ප්‍රජාවගේ යෝජනා ලබා ගැනීම සඳහා කොත්මලේ ප්‍රජා ගුවන් විදුලියේ ශ්‍රවණ කලාප ආශ්‍රිතව විවිධ පුද්ගලයන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.

### 1:3:7:2:3 ලෝකයේ සාර්ථක ප්‍රජා ගුවන් විදුලි සේවා ක්‍රමවේදය අධ්‍යයන

කොළොම්බියා ප්‍රෙටෙන්ෂා, නේපාලයේ සාගර්මාතා මෙන්ම ඉන්දියානු මෙන්ම බංග්ලාදේශ ප්‍රජා ගුවන් විදුලි පිහිටුවීම සඳහා එරට තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශ විසින් නිකුත් කරන ලද කෙටුම්පත් සලකා බලන ලදී.

### 1:3:7:2:4 ලාංකේය ප්‍රජා ගුවන් විදුලි වැඩසටහන් ශ්‍රවණය හා විශ්ලේෂණය

දැනට ක්‍රියාකාරී මට්ටමේ පවතින හා ස්ථාපිතව පැවැති ප්‍රජා ගුවන් විදුලි සේවා වල වැඩසටහන් ශ්‍රවණය මගින් විශ්ලේෂණාත්මකව දත්ත සම්පාදනය කර ගන්නා ලද්දේ ඒවා කොතෙක් දුරට ප්‍රජා ගුවන් විදුලි සංකල්පය හා සබැඳේද යන්න පිළිබඳව අධ්‍යයනය කරමිනි.

## 1:3:8 දත්ත විශ්ලේෂණය

පර්යේෂණ ක්‍රියාවලියෙන් අනතුරුව සකසනු ලබන මාගේ නිබන්ධනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලාංකේය ප්‍රජා ගුවන් විදුලිය බල ගැන්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලීමයි. මෙකී අරමුණට උචිත වන ආකාරයෙන් මෙන්ම නිබන්ධනයේ අභිමතාර්ථ වලට පිළිතුරු සැපයෙන ආකාරයෙන් ද දත්ත විශ්ලේෂණයක යෙදීමට නියමිතය.